දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650

ලේකම් / செயலாளர் / Secretary: 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල

இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை

No. 1200/9, Rajamalwatta Road, Battaramulla


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/02-05/03/2020

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2020.07.31

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 07/2020

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>පූර්ව තනතුර සඳහා ඉදිරිපත් කර ඇති වෛද්‍ය පරීක්ෂණ වාර්තාව රජයේ සේවයේ වෙනත් තනතුරක් සඳහා අදාළ කර ගැනීම</u>

නිලධාරියාගේ කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වය රජයේ සේවයට සුදුසු බවට සෞඛ්‍ය 169 ආකෘති පත්‍රය ඉදිරිපත් කර ඇති රජයේ ස්ථිර පත්වීමක් ලද නිලධාරියකු සේවා බිඳීමක් නොමැතිව රජයේ සේවයේ වෙනත් තනතුරකට පරිවාස කාලයකට යටත්ව බඳවා ගෙන ඇති අවස්ථාවකදී, එම නිලධාරියා පූර්ව තනතුර සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇති වෛද්‍ය පරීක්ෂණ වාර්තාව නව තනතුර සඳහා අදාළ කර ගැනීමට පත්වීම් බලධරයාට අනුමැතිය ලබාදිය හැක්කේ ය.

02. එවැනි අනුමැතියක් ලබාදෙන අවස්ථාවකදී, නිලධාරියා පූර්ව තනතුර සඳහා ඉදිරිපත් කර ඇති සම්පූර්ණ කරන ලද සෞඛ්‍ය 169 ආකෘති පත්‍රය නිලධාරියාගේ නව තනතුරට අදාළ පුද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් පත්වීම් බලධරයා විසින් ගත යුත්තේ ය.

03. එලෙස වුවද නවක නිලධාරියා පත්කරනු ලබන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට මෙවැනි නිලධාරියකු නව වෛද්‍ය පරීක්ෂණයක් සඳහා යොමු කිරීමට මෙමගින් බාධාවක් නොමැත්තේ ය.

04. නව පත්වීමක් ලෙස නැවත සේවයේ පිහිටුවන ලද රජයේ ස්ථිර පත්වීමක් ලද නිලධාරියෙකු සම්බන්ධයෙන් ද ඉහත සඳහන් විධිවිධානයන් අදාළ කර ගැනීමට පත්වීම් බලධරයාට හැකියාව ඇත්තේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ජී.බී.දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව